# සාමාන්‍ය සමයේ දස අටවන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

ද්විතීය නීති සංග්‍රහයෙන් ගත් පාඨයෙකි.

ද්විතීය නීති සංග්‍රහය 4: **32-40**

"ඔබේ පියවරුන්ට උන් වහන්සේ ප්‍රේම කළ නිසා ඔවුන්ගේ පෙළපත තෝරා ගත් සේක."

මෝසෙස් ඉශ්‍රායෙල්වරුන්ට කතා කොට මෙසේ කීය. "දෙවියන් වහන්සේ මිහි පිට මිනිසා මැවූ දා සිට මේ දක්වා ගෙවී ගිය දීර්ඝ කාලය තුළ වේවා, අහසේ එක්කොණක සිට අනික් කොණ දක්වා වේවා, මෙයාකාර මහා දෙයක් සිදු වූ බවක් හෝ එවැන්නක් ගැන ඇසූ බවක් හෝ දැනගන්නට තිබේද? ගින්න මැද සිට කතා කළ දෙවියන් වහන්සේට ඔබ සවන් දුන්නාක් මෙන් කිසියම් සෙනගක් උන් වහන්සේගේ හඬට සවන් දී ජීවත්ව සිටිත් ද? ඔබ බලා සිටියදී ම මිසරයේ දී ඔබේ දෙවි ස්වාමින් වහන්සේ ඔබට කළ සියල්ල අනුව වෙන කිසියම් දෙවි කෙනෙක්, අභියෝග දක්වා හාස්කම් හා අරුම පුදුම දේ පා, යුද්ධයෙන් ද, බාහු බලයෙන් හා දිගු කළ හස්තයෙන් ද මහා බිය ජනක දේ කර, එක් ජාතියක් තවත් ජාතියක් මධ්‍යයෙන් තෝරා ගන්නට වැඩිය සේක් ද? මේ දේ පමණක් පෙන්වන ලද්දේ සමිඳාණන් වහන්සේ ම දෙවියන් වහන්සේ බවත්, උන් වහන්සේ හැර අන් දෙවි කෙනෙකු නැති බවත් ඔබ දැනගන්න පිණිස ය. උන් වහන්සේ ඔබට උපදෙස් දෙනු සඳහා සිය හඬ ස්වර්ගයෙන් ඇසෙන්නට සැලසූ සේක. මිහි පිට තව මහා ගින්නක් ඔබට දැක්වූ සේක. ගින්න මැද සිට උන් වහන්සේගේ කටහඬ ඔබට ඇසිණි. ඔබේ පියවරුන්ට උන් වහන්සේ ප්‍රේම කළ නිසා, ඔවුන්ගෙන් පැවත ආ පෙළපත

තෝරාගෙන මහා බලය පා මිසර දේශයෙන් උන් වහන්සේම ඔවුන් ගෙනා සේක. අද ඔබට අයිති වී තිබෙන හැටියට ඔබ ගෙනැවිත් ඔබට උරුම කොට, ඒ රට දෙන පිණිස ඔබට වඩා ගණනින් විශාල බලවත් ජාතීන් ඔබට පෙරටුවෙන් පන්නා දැමූ සේක. එබැවින් සමිඳාණන් වහන්සේ ඉහළ ස්වර්ගයෙහිත්, පහළ මිහි පිටත් වැඩ වසන දෙවියන් වහන්සේ බවත්, උන් වහන්සේ හැර අන් දෙවි කෙනෙකු නැති බවත් මෙදින වටහා ගෙන තරයේ සිතින් මෙනෙහි කරන්න. ඔබට ද ඔබෙන් පසු ඔබේ පෙළපතට ද ශුභ සිද්ධිය සැලසෙනු පිණිසත්, දෙවි සමිඳාණන් වහන්සේ සදහට ම ඔබ හට දානය කරන දේශයෙහි ඔබ දීඝායු වළඳන පිණිසත් මා ඔබට අද දින අණ කරන උන් වහන්සේගේ නීති සහ නියෝග ඔබ පිළිපැදිය යුතු ය.”

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 77: 12 – 15, 20

පිළිතුර: සමිඳුනි, ඔබේ ක්‍රියා සියල්ල මම සිහි කරන්නෙමි.

ගීය:

සමිඳුනි, ඔබේ ක්‍රියා සියල්ල මම සිහි කරන්නෙමි. ඔබේ ප්‍රබල ක්‍රියා ගැන මම භාවනා කරන්නෙමි.

අහෝ දෙවිඳුනි, ඔබේ ක්‍රියා මාර්ගය විශුද්ධ ය.
අපේ දෙවිඳුන්ට වඩා ශ්‍රේෂ්ඨ දෙවි කෙනෙක් ඇද්ද? හාස්කම් පාන දෙවිඳාණෝ ඔබ වහන්සේ ය. ජාතීන් අතර ඔබේ බල මහිමය පෙන්වා ඇත්තේ ය.

ඔබේ බලවත් හස්තයෙන් ඔබ තුමන් සෙනඟ මුදා ලූ සේක.
ජාකොබ්ගේ සහ ජෝශප්ගේ පෙළපත් ඔබ ගළවා ලූ සේක.
මෝසෙස්ගේ හා ආරොන්ගේ මග පෙන්වීම ඇතිව, ඔබ ඔබේ ජනතාව බැටළුවන් මෙන් ගෙන ගිය සේක.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳාණෙනි, කථා කළ මැනව.
ඔබවහන්සේගේ මෙහෙකරුවා සවන් දී සිටියි.
සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබවහන්සේ වෙත ය.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝ ය.
ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය"යි ස්වාමීන් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 16: 24-28

"යමෙකුට සිය දිවි වෙනුවට කුමක් දිය හැකි ද?"

ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්ට කතා කොට මෙසේ වදාළ සේක. "යමෙක් මා අනුව එන්නට කැමැත්තේ ද, ඔහු තමකම නසා කුරුසිය දරමින් මා අනුව ඒවා! මන්ද, සිය දිවි රැකගන්නට කැමැති තැනැත්තේ එය නැති කර ගන්නේය. මා උදෙසා සිය දිවි නැති කරගන්නා එය රැක ගන්නේය. යමෙකු මුළු ලෝකයම ලබා ගත්තත්, සිය දිවි නැති කරගත්තොත් ඔහුට කිනම් ප්‍රයෝජනයක් ද? නොහොත් යමෙකුට සිය දිවි වෙනුවට කුමක් දිය හැකිද? මනුෂ්‍ය පුත්‍රයාණෝ සිය පියාණන්ගේ තේජශ්‍රීයෙන් තම දූතයන් පිරිවරා වඩින සේක. එකල උන්වහන්සේ එකිනෙකාට තම තමන්ගේ ක්‍රියා අනුව පල විපාක දෙන සේක. සැබැවින්ම මම ඔබට කියමි. මනුෂ්‍ය පුත්‍රයාණන් ස්වකීය රාජශ්‍රීයෙන් වඩිනු දක්නා තෙක් මෙහි සිටින්නවුන්ගෙන් සමහරෙක් කිසිසේත් මරණයට පත් නොවෙති."

සුවිශේෂ වාක්‍යය එසේය.